සැ. යු. - මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2021 වර්ෂය සඳහා ගාල්ල-බලපිටිය දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,217 - 2021 පෙබරවාරි මස 25 වැනි බ්‍රහස්පතින්දා - 2021.02.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 86 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

*සැ. යු.* - (i) වර්ල්ඩ් ලයිෆ් ලයින් යෝගා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2021 පෙබරවාරි මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) වයිට් රෝස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2021 පෙබරවාරි මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2021 මාර්තු මස 19 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 මාර්තු මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

85- B 082208 — 353 (2021/02)
D 1 -

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

### හලාවත දිසා අධිකරණයේ දී ය

නඩු අංකය : DDR/346/2017.
හලාවත දිසා අධිකරණයේ ඇස්කිසි අංකය : 05/2021.

1994 අංක 09 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) (සංශෝධන) පනතින් සංශෝධිත 1990 අංක 02 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනත යටතේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් හා සම්බන්ධ කාරණය පිළිබඳවයි.

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී. එල්. සී.,

*පෙර නාමය :*

පීපල්ස් ලීසිං කම්පැනි පී.එල්.සී.
අංක. 1161,
මරදාන පාර,
කොළඹ 08.

*.........................පැමිණිලිකරු.*

*එදිරිව*

01. අබ්දුල් හමීඩ් මොහමෙඩ් හස්මර්,
(Abdul Hameed Mohamed hasmar)
අංක 47,
බසාර්වීදිය, හලාවත.

02. වර්ණකුලසූරිය රොබින්සන් ප්‍රනාන්දු,
අංක 168,
මැදපාඩුව, වාඩියපාර, හලාවත.

03. සෝලංග ආරච්චිගේ ඉසිතිලක සම්පත් ජයසුන්දර
අංක 225,
දේවාල පාර,
දූන්කන්නාව, නාත්තණ්ඩිය

*...........................විත්තිකරුවන්.*

ඉහත නම් සඳහන් 1 වන විත්තිකරු වෙතටයි.

වර්ෂ 2017 ක් වූ නොවැම්බර් මස 17 දින කොළඹ දිසා අධිකරණයේ අතිරේක දිසා විනිසුරු අමාලි රණවීර මැතිණිය ඉදිරිපිට දී සුදුස්සක් කිරීමට ඉදිරිපත් වූ අවස්ථාවේ පැමිණිල්ලද සමග අමුණා ඇති ලියවිලි ද සලකා බැලීමෙන් පසු පැමිණිලිකාර ආයතනයේ බලයලත් නිලධාරියෙකු විසින් ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශයේ අඩංගු ප්‍රකාශයන් පිළිබඳව සෑහීමකට පත්ව ආඥා කොට තීන්දු ප්‍රකාශ කරන වග නම්,

එනම්, 2017.07.25 දිනට ශ්‍රී ලංකා මුදලින් රුපියල් අනූහයලක්ෂ පනස්හතර දහස් එකසිය අනූහයක් සහ ශත තිස්හයක (රු.9,654,196.36) මුදලක් හා එකී වූ මුදලින් හිඟ වාරික මුදල ලෙස වන අයවිය යුතු රු. 9,213,096.21 ක මුදලක් මත 2017.07.26 දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය දක්වා වර්ෂයකට 18% ක් බැගින් වූ පුණ්‍යාධාර පොළී ප්‍රතිශතයක් මත ගණනය කළ පොළියද, වර්ෂයකට 12% බැගින් වූ පසුවිපරම් ගාස්තු ප්‍රතිශතයක් මත ගණනය කළ පොළියද තීන්දු ප්‍රකාශිත දින සිට, තීන්දු ප්‍රකාශිත සම්පූර්ණ මුදල මත අදාළ නෛතික පොළියද එම මුදල අයකර ගැනීම සඳහා 1994 අංක 09 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනතෙන් සංශෝධිත 1990 අංක 02 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 04 වන වගන්තිය ප්‍රකාරව විත්තිකරුවන්ට විරුද්ධව ඇතුළත් කරන ලද නෛසයි තීන්දු ප්‍රකාශය අනුව නඩු ගාස්තු ද ඉහත නම් සඳහන් විත්තිකරුවන් විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු බවට ද, තව ද, එකී නඩුවේ තීන්දු ප්‍රකාශය ඉටු කිරීමට එකී 1 වන, 2 වන සහ 3 වන විත්තිකරුවන් අපොහොසත් වී/පැහැර හැර ඇති හෙයින්, එකී නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති ඇස්කීසියේ බලය පිට ඉහත නම් සඳහන් 1 වන විත්තිකරුට අයිතිය යටතේ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළෙහි හිමිකම් අයිතිවාසිකම් හා ඊට අදළ සෑම සියලු දේ, කොළඹ දිසා අධිකරණයෙන් මා වෙත නිකුත් කරන ලද ඇස්කීසිය මත මෙම ඉඩමට අදාලව යම් උකස්කර ඇත්නම් එම

උකස්කරයන්ට යටත්ව හලාවත දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් වන මා විසින් වර්ෂ 2021 ක් වූ ජනවාරි මස 26 වන දින, නිසිලෙස තහනම් කරන ලද පහත උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ, වර්ෂ **2021 ක් වූ මාර්තු මස 19 වැනි දින පෙරවරු 11.00** ට එකී දේපල පිහිටා ඇති හලාවත, බසාර් වීදිය, අංක 47 දරන ගොඩනැගිල්ල පිහිටි ස්ථානයේ දී ම මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*දේපලට පිවිසෙන මාර්ගය.-* හලාවත නගර මධ්‍යයේ, බසාර් විදියෙහි මීටර් 400 ක් පමණ ගිය පසු වම් පසින් අංක 47 ස්ථානයෙහි මෙම ඉඩම හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් ගෙවීම් ගැණුම්කරු විසින් මා වෙත ගෙවිය යුතුය.

සියලුම ගෙවීම් මුදලින් පමණක් කල යුතු අතර චෙක්පත් බාරගනු නොලැබේ.

1. සම්පූර්ණ ගැණුම් මුදලෙන් 25% ක මුදලක් පමණක් ගෙවනු ලබන්නේ නම් ඉතිරි 75% ක මුදල වෙන්දේසි දින සිට දින තිහක් (30) ඇතුළත ඉහත අංක දරන නඩුවට අධිකරණයේ තැන්පත් කළ යුතුය.

2. පිස්කල් ගාස්තු/වෙන්දේසි ගාස්තු සහ රජයේ ගාස්තු.

**උපලේඛනය**

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත් උතුරු පිටිගල් කෝරලයේ ආනවිලුන්දන් පත්තුවේ බසාර් වීදිය හලාවත නගර සීමාව සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් දකුණු පිටිපන ග්‍රාම නිලධාරී වසමේ පිහිටි හලබක්කාගේ ගාල නැ/පැත්තේ බෙදූ 1/2 පංගුව කොටස සඳහා මායිම්

උතුරට : බසාර් වීදිය
නැගෙනහිර : පාරකට අත්හැරී ඉඩම
දකුණ : පාරකට අත්හැරී ඉඩම
බස්නාහිර : B අබු බසාර් හා තව අයට මෙම ඉඩමේ අනෙක් කොටස

යන මායිම් තුල පිහිට පර්චස් පහක් (අ. 0, රූ. 0, පර්. 5) විශාල ඉඩමේ බිම සහ ඊට අයිති ගහකොළ, පලතුරු ආදී සියලු දේද සමග වේ.

ඉහත විස්තර කරන ඉඩම පහත විස්තර කරන පරිදි නැවත මැන සාදන ලදී.

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත් උතුරු පිටිගල් කෝරලයේ ආනවිලුන්දන් පත්තුවේ බසාර් වීදිය හලාවත නගර සීමාව සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් දකුණු පිටිපන ග්‍රාම නිලධාරී වසමේ පිහිටි හලබක්කාගේ ගාල නැ/පැත්තේ බෙදූ 1/2 පංගුව ඉඩමට වර්ෂ 2012 ක් වූ ජනවාරි මස 23 වන දින එස්. ශ්‍රීධරන් අවසර ලත් මිනින්දෝරු මහතා විසින් මැන සාදන ලද අංක 5112 දරන පිඹුරේ කැබලි අංක 01 ලෙස ලකුණු කරන කොටස සඳහා මායිම්.

නැගෙනහිරට : බ්‍රයිට් සිටි
දකුණට : තමියාලි වෙළඳ සැල
බස්නාහිරට : හලාවත සපත්තු සාප්පුව

යන මායිම් තුළ පිහිටි පර්චස් පහයි දශම දෙකයි පහයි (අ. 0, රූ. 0, පර්. 5.25) විශාල ඉඩමේ බිම සහ ඊට අයිති ගහකොළ, පලතුරු ආදී සියලු දේද සමග වේ.

මෙම ඉඩම දැනට හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක A132/19 දරන පත්ඉරුවෙහි ලියාපදිංචි වී ඇත.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
හලාවත.

2021 ක් වූ පෙබරවාරි මස 10 වැනි දින දී ය.

02-730

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.